## ක්‍රිස්තු උත්ථාන මංගල මහෝත්සවය | දේව ප්‍රකාශන

05-04-15

## පළමුවන දේව ප්‍රකාශනය

ක්‍රියා 10:34,37-43

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයකි.

**මළවුන්ගෙන් උත්ථාන වූ ස්වාමීන් වහන්සේ සමග අපි ආහාර පාන වැළඳුයෙමු.**

එවිට පේදුරු මෙසේ කීය. "දෙවියන් වහන්සේ මිනිසුන්ගේ තරාතිරම් නොබලන බව දැන් මට සැබැවින්ම පැහැදිළිය. ජොහාන් ප්‍රකාශ කළ බෞතීස්ම ස්නාපනයට පසු ගලීලය පටන් ජුදය මුළුල්ලෙහි සිදුවූ දේ ඔබ දන්නහුය. දෙවියන් වහන්සේ ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද නාසරෙත්හි ජේසුස් වහන්සේ ආලේප කළ සැටිත්, දෙවියන් වහන්සේ උන්වහන්සේ සමග සිටි බැවින්, උන්වහන්සේ යහපත් ක්‍රියා කරමින්ද යක්ෂයා විසින් පීඩා කරන ලද සියල්ලන් සුව කරමින්ද හැසිරුණු සැටිත් ඔබ දන්නහුය. උන්වහන්සේ ජුදෙව්වරුන්ගේ රටෙහිද ජෙරුසලමෙහිද කළ සියල්ලට අපි සාක්ෂිකරුවෝ වම්හ. ඔවුහු උන්වහන්සේ ගසක එල්ලා මැරූහ. එහෙත් දෙවියන් වහන්සේ තුන්වන දා උන්වහන්සේ උත්ථාන කොට දර්ශනය වන්නට සැලැස්සූ සේක. උන්වහන්සේ සියල්ලන්ටම පෙනුණේ නැත. පෙනුණේ දෙවියන් වහන්සේ විසින් කලින් තෝරාගන්නා ලද සාක්ෂිකරුවන් වන, උන්වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වූ පසු උන්වහන්සේ සමග එකට කෑවා වූ බීවා වූ අපටමය. ජීවත් වන්නවුන්ගේද මළවුන්ගේද විනිශ්චය කාරයාණන් වන පිණිස දෙවියන් වහන්සේ විසින් නියම කරන ලද තැනැත්තාණන්, උන්වහන්සේ බව සෙනගට ප්‍රකාශ කරන්නටත් සාක්ෂි දෙන්නටත් උන්වහන්සේ අපට අණ කළ සේක. උන්වහන්සේ අදහන සියල්ලන්ට උන්වහන්සේගේ නාමයේ අනුහසින් පව්කමාව ලැබෙන බවට සියලු දිවැසිවරයෝ සාක්ෂි දෙති" යි කීය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 118:1-2, 16-17, 22-23

පිළිතුර:මෙන්න, සමිඳුන්ගේ ජය මංගල දිනය; මෙදින අපි ප්‍රීති සන්තෝෂ වෙමු.

ගීය: සමිඳුන්ට ස්තුති කරන්න, මන්ද එතුමාණෝ යහපත්ය. එතුමන්ගේ තිර පෙම සදාකාලයටම පවත්නේය. "එතුමන්ගේ තිර පෙම සදාකාලයටම පවත්නේය"යි ඊශ්‍රායෙල් දැන් කියත්වා.

සමිඳුන්ගේ බාහු බලය උදාර ය. සමිඳුන්ගේ බාහු බලය විකුම් දක්වයි. මම නොනැසී ජීවත්ව සිටින්නෙමි. සමිඳුන්ගේ ක්‍රියා ප්‍රකාශ කරන්නෙමි.

ගෘහ ශිල්පීන් ඉවත ලූ ගල ම මුල් ගල වී ඇත. මෙය සමිඳුන්ගේ ක්‍රියාවකි. එය අපේ දෙනෙතට අසිරිමත්ය.

## දෙවන දේව ප්‍රකාශනය

කොලොස්සි 3:1-4

ශුද්ධ වූ පාවුලු අපෝස්තුළු තුමන් විසින් කොලොස්සිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**ක්‍රිස්තුස් වහන්සේ වැඩසිටින තැන ඇති, ලෝකෝත්තර දේ සොයා යන්න.**

ඔබ ක්‍රිස්තුස් වහන්සේ සමග උත්ථාන කරනු ලැබූ බැවින් දෙවියන් වහන්සේගේ දකුණු පස වැඩහිඳින ක්‍රිස්තුස් වහන්සේ වැඩසිටින තැන ඇති, ලොව්තුරු දේ ප්‍රාර්ථනා කරන්න. ලෞකික දේ කෙරෙහි නොව ලොව්තුරු දේ කෙරෙහි ඔබේ සිත යොමුකරන්න. මන්ද, ඔබ මැරුණු බැවින් දැන් ඔබේ ජීවිතය ක්‍රිස්තුස් වහන්සේ සමග දෙවියන්

වහන්සේ තුළ සැඟවී පවතියි. අපේ ජීවනය වන ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශ වන විට, ඔබත් උන්වහන්සේ සමග තේජසින් ප්‍රකාශ වනු ඇත.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්ත්‍රෝත්‍ර වේවා.

**නැතහොත් පහත සඳහන් පාඨයද දෙවැනි කියැවීම සඳහා යොදා ගත හැක.**

## <u>දෙවන දේව ප්‍රකාශනය</u>

1කොරින්ති 5:6-8

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් ගත් කොටසකි.

**පරණ මුහුන් ඉවත්කර නව නුමුහුන් පිටි පිඩක් වන්න.**

ඔබගේ පාරට්ටුව නොහොබී. මුහුන් බිඳකින් මුළු පිටි පිඩක් පිපෙන බව ඔබ නොදන්නාහුද? ඔබ හැම අතින්ම පිරිසිදු වන පිණිස පාපය නැමති මුහුන් ඉවත් කරන්න. එවිට ඔබ අලුත් නුමුහුන් පිටි පිඩක් මෙන් වන්නාහුය. ඔබ දැනටම එසේ බව මම දනිමි. එසේ වන්නේ අපේ පාස්කු බැටළුවා වන ක්‍රිස්තුස් වහන්සේ පූජා කර ඇති බැවිනි. එබැවින් පරණ මුහුන් වලින්වත්, ඊර්ෂ්‍යාව හා දුෂ්ටකම නැමති මුහුන් වලින්වත් නොව, අවංක කමද සත්‍යයද නැමති නුමුහුන් රොටියෙන් පාස්කු මංගල්‍යය පවත්වමු.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්ත්‍රෝත්‍ර වේවා.

## <u>සුපුවත් ජය නද</u>

1කොරින්ති 5:7-8

ආලේලූයා! ආලේලූයා!<br>
අපගේ පාස්කු බැටළුවා වන ක්‍රිස්තුස් වහන්සේ පූජා කරනු ලැබූ සේක.<br>
එබැවින් අප සැම ඒ මංගල්‍යය උත්සවාකාරයෙන් පවත්වමු.<br>
ආලේලූයා!

## <u>ශුද්ධවූ සුවිශේෂය</u>

ජොහන් 20:1-9

ජොහන් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැගිට වදාළ යුතුමය.**

සතියේ පළමු වනදා හිමිදිරියේම, අඳුර තිබියදී, මග්දලායේ මරියා සොහොන් ගෙය ළඟට අවුත්, සොහොන් ගෙයින් ගල ඉවත් කොට තිබෙන බව දුටුවාය. එබැවින් ඈ සීමොන් පේදුරු ද ජේසුස් වහන්සේ ප්‍රේම කළ අනික් ශ්‍රාවකයා ද වෙත දුව ගොස්, "ඔවුන් සමිඳාණන් වහන්සේ සොහොන් ගෙයින් ඉවතට ගෙන ගොස් තිබේ. ඔවුන් උන්වහන්සේ කොතැනක තැබුවාද කියා අපි නොදනිමු" යි කීවාය. එවිට පේදුරු ද අනික් ශ්‍රාවකයා ද නික්ම විත් සොහොන් ගේ දෙසට ගියහ. දෙදෙනාම එක්ව දිව්වෝය. අනික් ශ්‍රාවකයා පේදුරු පසු කර දුව ගොස් පළමුවෙන් සොහොන් ගෙට පැමිණ, නැමී බලා, සිහින් හණ රෙදි එහි තිබෙන බව දිටීය. එහෙත් ඔහු ඇතුළට නොගියේය. සීමොන් පේදුරු ඔහුට පසුව පැමිණ සොහොන් ගේ ඇතුළට ගොස්, හණ රෙදි එහි තිබෙන බවත්, උන්වහන්සේගේ හිස ඔතා තිබූ රෙදි කඩ, හණ රෙදි සමග නොව, වෙනම එක් තැනෙක අකුළා තිබෙන බවත් දුටුවේය. එකල සොහොන් ගේ ළඟට පළමුවෙන් පැමිණී ඒ අනික් ශ්‍රාවකයා ද, ඇතුළට ගොස් දැක විශ්වාස කෙළේය. උන්වහන්සේ මළවුන්ගෙන් නැගිට වදාළ යුතු යයි ලියන ලද ශුද්ධ ලියවිල්ල, ඒ වන තුරු ඔවුන් තේරුම් ගෙන සිටියේ නැත.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.